මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| නර්තනය | 11 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..............................................................................................................................

**සැලකිය යුතුයි**

❖ **සියලුම අයදුම්කරුවන් 1 කොටසේ ප්‍රශ්න 30 ටම පිළතුරු සැපයිය යුතුයි එයට අමතරව ii උඩරට නර්තනය හෝ iii පහතරට නර්තනය යන කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

### I කොටස

- අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන තෝරන්න.

01. පෝරණුව භාවිතයට ගන්නේ ......................................... කර්මාන්තයේදීය.

1. පතල් 2. තේ 3. මැටි 4. කොහු

02. දවුල සුදු රෙදි කඩකින් වසා ................................. වාදනය කිරීම චාරිත්‍රයකි.

1. වද බෙර 2. අණ බෙර 3. මළ බෙර 4. තේවා බෙර

03. රාජ සභාව තුළ සෙමෙර සැලීම ඇසුරු කරගනිමින් ....................... කවි විශේෂය නිර්මාණය වී ඇත.

1. චාමර 2. සවරං 3. ප්‍රශස්ති 4.නමස්කාර

04. පහතරට ශාස්ත්‍රීය බෙරපද වාදනය වන අවස්ථා දැකිය හැකි ගැමි නාටකයක් ලෙස ....................... හැඳින්විය හැකිය.

1. සොකරි 2. කෝළම් 3. නාඩගම් 4. නූර්ති

05. මුල් කාලයේදී .......................... ගායනය සඳහා පමණක් යොදා ගෙන ඇත.

1. වන්නම් 2. වට්ටම් 3. ගැමි නැටුම් 4. ගැමි නාටක

06. "තත් ජිත් තොං නං" යන බීජාක්ෂර සතර යොදා ගෙන වාදනය කරන වාද්‍ය භාණ්ඩ වන්නේ ....................... ය.

1. ගැටබෙරය හා දවුල 2. ගැටබෙරය හා පහතරට බෙරය

3. පහතරට බෙරය හා දවුල 4. දවුල හා තම්මැට්ටම

07. කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ සෞන්දර්ය අධ්‍යයන ආයතනය ................. වසරේ පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් විය.

1. 1992 2. 1974 3. 1978 4. 2005

08. "රණේ රුව සෙ වත රුවින් දිලේ දෝ ......." යන කවිය ............... නැටුම සඳහා ගායනා කරයි.

1. කළගෙඩි 2. මෝල්ගස් 3. රබන් 4. කුළු

09. බෙර වාදනයෙන් තොරව අභ්‍යාසයේ යෙදෙන මූලික සරඹ ............ නමින් හඳුන්වයි.

1. පා සරඹ 2. ගොඩ සරඹ 3. අත් සරඹ 4. ඉලංගම් සරඹ

10. ශාන්තිකර්මවල එන හත්පද පෙළපාලි දක්නට ලැබෙන්නේ .............සම්ප්‍රදායන්වලදීය.

1. උඩරට හා සබරගමු
2. උඩරට හා පහතරට
3. පහතරට හා ද්‍රවිඩ
4. පහතරට හා සබරගමු

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| A | අස්නෙ | යක් ඇනුම | යහන් දැක්ම | වාහල |
| B | දෙවොල් ගොඩ බැසීම | මගුල් බෙර | අත්‍යා බෙර | කප් සිටුවීම |
| C | අඹ විදමන | ශ්ලෝක | සිරස පාද | මඩු පේ කිරීම |

11. සම්ප්‍රදායන් තුනෙහි ප්‍රධාන ශාන්තිකර්මවල පොදු චාරිත්‍ර විධි දැකිය හැකි වන්නේ

1. A පේළියේ 2 හා 3 තීරුවලය
2. 1 තීරුවේ B හා C පේළිවලය
3. 4 තීරුවේ B හා C පේළිවලය
4. B පේළියේ 1 හා 3 තීරු වලය

12 එම ශාන්තිකර්මයන්හි ගායනය රහිත නර්තන අංග දක්නට ලැබෙන්නේ.

1. A පේළියේ 2 හා 3 තීරුවලය
2. C පේළියේ 1 හා 4 තීරුවලය
3. 4 තීරුවේ B හා C පේළිවලය
4. B පේළියේ 1 හා 4 තීරුවලය

13 දෙවොල් මඩු හා පහන් මඩු ශාන්තිකර්ම දෙකටම පොදු නාට්‍යමය පෙළපාලි දැක්වෙන්නේ

1. 1 තීරුවේ A හා B පේළිවලය
2. 1 තීරුවේ B හා C පේළිවලය
3. A පේළියේ 1 හා 4 තීරුවලය
4. Cපේළියේ 1තීරුවේ හා Aපේළියේ 4තීරුවේය

14. ශිල්පීය දක්ෂතා පෙන්වීම සඳහා කෙරෙන වාදන අවස්ථාව

1. B පේළියේ 2 තීරුවේය
2. B පේළියේ 2 හා 3 තීරුවලය
3. C පේළියේ 2 තීරුවේය
4. B පේළියේ 3 තීරුවේය

15. අනාසාතාත්මක ගායනා අවස්ථාවක් සඳහන් වන්නේ

1. C පේළියේ 2 හා 3 තීරුවලය
2. C පේළියේ 2 තීරුවේය
3. C පේළියේ 3 තීරුවේය
4. A පේළියේ 1 තීරුවේය

- පහත දැක්වෙන රූප රාමු ඇසුරින් අංක 16 - 20 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A



B

16. A හා B රූප වලින් දැක්වෙන දේශීය මුද්‍රා නාට්‍ය වනුයේ

1. කුඹී කතාව හා කරදිය යි
2. හංසවිල හා නල දමයන්තිය යි
3. කරදිය හා කුඹී කතාව යි
4. කුඹී කතාව හා නල දමයන්තිය යි

17. A රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ

1. වජිරා මහත්මිය විසිනි
2. පණිභාරත මහතා විසිනි
3. ශේෂා පලිහක්කාර මහතා විසිනි
4. චිත්‍රසේන මහතා විසිනි

18. A රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණය සිදු කර ඇත්තේ

1. සෝමබන්දු විද්‍යාපති මහතා විසිනි
2. චිත්‍රසේන මහතා විසිනි
3. මහින්ද ඩයස් මහතා විසිනි
4. ලයනල් අල්ගම මහතා විසිනි

19. B රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍යයේ කලා කටයුතු හා රංග වස්ත්‍ර නිර්මාණය සිදු කර ඇත්තේ

1. අංජලිකා චිත්‍රසේන ය
2. ටානියා බැරකෝමාය
3. මහේෂ් උමගිලිය ය
4. රොබට් ජුලියන්ගි ය

20. B රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍යයේ ප්‍රථම නිෂ්පාදනය සිදු වූයේ

1. 2005 වසරේදී
2. 2007 වසරේ දී
3. 2010 වසරේ දී
4. 2012 වසරේ දී

21. උඩරට හා පහතරට සම්ප්‍රදායන්ට අයත් ගැමි නාටක දෙකකි.

1. කඩු හා මෝල්ගස්
2. මෝල්ගස් හා රූකඩ
3. කෝළම් හා සොකරි
4. සොකරි හා කෝළම්

22. පණිභාරත මහතා විසින් නිර්මාණය කරන ලද නර්තන අංග වේ.

1. ගොයම් කැපීම හා නාරිලතා
2. පන් නෙලීම හා සුරඹා වල්ලිය
3. ගොයම් කැපීම හා ගිරිදේවි
4. පන් නෙලීම හා ගිරිදේවි

23. මහනුවර යුගයේ ප්‍රශස්ති ගායනය කර ඇත්තේ

1. දළදා මාළිගාවේදීය
2. මඟුල් මඩුවේදී ය
3. රජමාළිගාවේදී ය
4. කවිකාර මඩුවේදීය

24. දෙවියන්ගේ ආශීර්වාදය පතා වාදනය කරනුයේ

1. අණ බෙරය
2. මඟුල් බෙරය
3. හේවිසි ය
4. අත්‍යා බෙරය

25. හින්දුස්ථානී සංගීතය හා බැඳි කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වනුයේ

1. ලක්නව් හා ජායිපූර් ය
2. ආන්ද්‍රා හා මයිසූර්ය
3. දිල්ලි හා ආන්ද්‍රා ය
4. කේරළ හා ජායිපූර් ය

26. කථකලි නර්තනය සඳහා භාවිතා කෙරෙන වාද්‍ය භාණ්ඩ වන්නේ

1. මෘදංගය හා මද්දලයයි
2. තබ්ලාව හා චෙන්ඩාවයි
3. චෙන්ඩාව හා මද්දලයයි
4. නටුවාංගම් හා මාදංගයයි

27. භරත නාට්‍ය සම්ප්‍රදායට අයත් නර්තන අංග කිහිපයකි,

1. තෝඩායම් හා පුරප්පාඩ්  3. පදම් හා ශ්ලෝකම්

3. ආමද් හා සලාම්  4. පදම් හා සලාම්

28. සිංහල නර්තන සම්ප්‍රදායේ බොහෝ විට දක්නට නොලැබෙන්නේ

1. ආංගික අභිනයයි  2. වාචික අභිනයයි

3. ආහාර්ය අභිනයයි  4. සාත්වික අභිනයයි

29. ඇම්බැක්කේ දේවාලයේ ලී බාල්කයක දක්නට ලැබෙන්නේ

1. කළගෙඩි නැටුමකි  2. කඩු නැටුමකි

3. කුළු නැටුමකි  4. ලී කෙලි නැටුමකි

30. ප්‍රාසාංගික නර්තනයක් ඉදිරිපත් කිරීමේදී වේශ නිරූපණය හා රංග වස්ත්‍රාභාරණ හැරුණු විට වඩා වැදගත් වන්නේ,

1. රංග උපකරණ හා පසුතල නිර්මාණයයි

2. ගායක කණ්ඩායම හා වේදිකා උපකරණයි

3. විදුලි ආලෝකය හා වාද්‍ය භාණ්ඩයි

4. රංග උපකරණ හා රංග රචනයයි

## II කොටස ( උඩරට නර්තනය)

31. උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වනුයේ

1. සත් කෝරළය , සතර කෝරළය , හාරිස්පත්තුව

2. සත්කෝරළය , සතර කෝරළය , කුකුළු කෝරළය

3. සත් කෝරළය , සතර කෝරළය , රත්නපුර

4. මහනුවර , නුවර එළිය , තංගල්ල

32. "සුරිඳුන් පෙර සිටන් " මෙම කවි පදය ගායනය සඳහා සුදුසු බෙර පදය වන්නේ,

1. දොං ජිංත ගත දොංත ය  2. ජිං තකට තරි තකට ය

3. දෝං ජිං ජිං තකට දොං තක ය  4. දොං දොං ජිං ජිං ගජි ගත ය

33. සුළු මැදුම් දෙතිතේ තාලයට වාදනය කළ හැකි අලංකාර බෙර පදය කි

1. දොදොංත තකු දොං

2. ජිං තකු කුද කුද කුජිගත

3. දොංතකු දොංජිංතත් ජිංතත් ජිං තරිකිට

4. දොංතකු දොංජිං ජිං ගත්තත් ජිං ගත් තත් ජිං ජිං තරිකිට

34. "කුදාංත ගත දොං" වට්ටම නටනු ලබන්නේ,

1. මාත්‍රා 2+2+3 තාල රූපයට ය  2. මාත්‍රා 2+2+4 තාල රූපයට ය

3. මාත්‍රා 2+3+4 තාල රූපයට ය  4. මාත්‍රා 3+3+4 තාල රූපයට ය

35. උඩරට නර්තනයේදී පමණක් මේවා භාවිතා වේ,

1. ගැට බෙරය හා පතා බෙරය  2. උඩරට බෙරය හා බුම්මැඩිය

3. ගැටබෙරය හා උඩැක්කිය  4. පොකුරු බෙරය හා උඩැක්කිය

36. කොහොඹා කංකාරියේදී පමණක් දක්නට ලැබෙන නර්තන අංගයකි.

1. මඩු පේ කිරීම හා අයිලෙ යැදීම	2. යක් ඇනුම හා යක්තුන්පදය
3. ගුරුගේ මාලාව හා කප් සිටුවීම	4. යක්ඇනුම හා පූනාව පේ කරීම

37. දේශීය මුද්‍රා නාට්‍ය නිර්මාණයේදී කොහොඹාකංකාරියේ එන පහත සඳහන් අංග තුලින් යම් කිසි ආභාෂයක් ගත හැකිය

1. උඟරා යක්කම හා ගුරුගේ මාලාව	2. ගබඩා කොල්ලය හා බුලත් පදය
3. අස්නෙ හා නයා යක්කම	4. මුවමල විදීම හා මඩුපුරය

38. සොකරි නාටකය රඟ දක්වා ඇත්තේ

1. බෝවන රෝග නිවාරණය කෙරෙන ශාන්තිකර්මයක් වශයෙනි
2. විදේශිකයින්ගේ පැමිණීම සම්බන්ධ පූජා කර්මයක් වශයෙනි
3. සමාජ දුර්වලතා විවරණය කෙරෙන හාස්‍ය ජනක නාටකයක් වශයෙනි
4. සශ්‍රීකත්වය පදනම් කරගත් පූජා කර්මයක් වශයෙනි

39. "ජෙං තත් තත් ......." මෙය

1. මාත්‍රා 2+4 තාලරූපයට අයත් කස්තිරමක කොටසකි
2. මාත්‍රා 2+4 තාල රූපයට අයත් අඩව්වක කොටසකි
3. මාත්‍රා 2+4 තාල රූපයට අයත් සීරුමාරුවක කොටසකි
4. මාත්‍රා 2+2 තාල රූපයට අයත් කස්තිරමක කොටසකි

40. ගැටබෙරය සාදා ගැනීම සඳහා භාවිතා කරන දැව වර්ගය

1. පොල් , තේක්ක , කොහොඹ	2. නා , සපු , කොස්
3. කොස් , ඇහැළ , කොහොඹ	4. නැදුන් , කොස් , තේක්ක

## III කොටස (පහතරට නර්තනය )

31. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වනුයේ

1. මාතර , බෙන්තර , රයිගම ය	2. මාතර , කිරිඇල්ල, ගාල්ල ය
3. ගාල්ල, කුරුණෑගල , ගම්පහ ය	4. මාතර , වැලිගම , කලවාන ය

32. "සඳ සන්දර - දිගු පුන් ගිර ......" මෙම කවිය ගායනය සඳහා සුදුසු බෙර පදය වන්නේ

1. ගුං දෙගත ගත් ත ගුං ය	2. තක දිත් තක දොම් දොම් දිම් තක දොම් ය
3. දෙගත් ගතකු දොම් ය	4. දොම් තම්ගත ගදිතම් ගත ගුගුදම් ගත ගදිතම්ය

33. සුළු මැදුම් දෙතිතේ තාලයට වාදනය කළ හැකි අලංකාර බෙර පදයකි

1. ගුංද ගති ගත ගත්ත ගුදි ගුද	2. ගුද ගදිගත ගුද ගුද ගදිගත ගුද
3. ගුදි ගුද ගුදි ගුද ගත ගදි ගත ගදි ගත ගත	4. රෙගුං ගුදං ගත් දෙගත් ගතකු දොම්

34. ගුද ගති ගත වට්ටම නටනු ලබන්නේ

1. මාත්‍රා 2+3 තාල රූපයට ය	2. මාත්‍රා 2+2 තාල රූපයට ය
3. මාත්‍රා 2+2+3 තාල රූපයට ය	4. මාත්‍රා 2+2+4 තාල රූපයට ය

35. පහතරට නර්තනයේ දී පමණක් මේවා භාවිතා වේ

1. සොෂක බෙරය හා අයිලය
2. පහතරට බෙරය හා රහු කුට්ටම
3. දෙවොල් බෙරය හා උණුනු පියන
3. පොකුරු බෙරය හා වීදිය

36. දෙවොල් මඩු ශාන්තිකර්මයේ දී දක්නට ලැබෙන නර්තන අංගයකි

1. සුරල් පද හා යාග පද
2. දොවලේ පද හා හත් පද
3. සමයම් පද හා ගුරුගේ මාලාව
4. මුගුරු පද හා හත් පද

37. දේශීය මුද්‍රා නාට්‍ය නිර්මාණයේදී දොවොල් මඩු ශාන්තිකර්මයේ එන පහත සඳහන් අංග තුලින් යම් කිසි ආභාෂයක් ගත හැකිය

1. දෙවොල් ගොඩ බැසීම හා අඹ විදමන
2. නානුමුරය හා කුමාර පෙළපාලිය
3. අඹ විදමන හා පොත්කඩේ පාලිය
4. දෙවොල් ගොඩබැසීඹ හා අසුර යක්කම

38. කෝළම් නාටක රඟ දැක්වීම තුලින් විද්‍යමාන වන්නේ,

1. එවක සමාජයේ හුදු විනෝදාස්වාදය සඳහාය
2. උසස් සමාජ කණ්ඩායම් විවරණයට ලක් කිරීමයි
3. බෝවන රෝග නිවාරණය හා ශාන්තිය සඳහායි
4. එවකට පැවති සමාජ විවරණය හා ශාන්තිය අපේක්ෂා කිරීමයි

39. "දොම් තම් දිම් ගත ගුගුදිත ...." මෙය

1. මාත්‍රා 2+4 තාල රූපයට අයත් අලංකාර බෙර පදයකි
2. මාත්‍රා 2+4 තාල රූපයට අයත් ඉරට්ටියක කොටසකි
3. මාත්‍රා 2+4 තාල රූපයට අයත් සුරලක කොටසකි
4. මාත්‍රා 2+4 තාල රූපයට අයත් අන්තාඩියක කොටසකි

40. පහතරට බෙරය සාදාගැනීම සඳහා භාවිත කරන දැව වර්ගය

1. තල් , කළුමැදිරිය , කළුවර
2. පොල් , වල් දෙල් , සපු
3. කිතුල් , පොල් , කොස්
4. කිතුල් , දෙල් , ගම්සූරිය

## නැටුම් (දේශීය) II කොටස

- ❖ පළමු වැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

01) සියළුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

1. උඩරට නර්තනයේදී ගොඩ සරඹ මෙන් පහතරට නර්තනයේදී .......................................... නටනු ලබයි.
2. රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වූයේ .................................... වර්ෂයේදීය.
3. "එදා එ ඇතු විදුමටආ වැදි හට " යන කවිය ................................................ කවිය කි.
4. ගුරු හාමි හා සොකරි ලක්දිවට පැමිණියේ දරු සම්පතක් ලබාගැනීම සඳහා ................... ............ දෙවියන්ට බාරයක් ඔප්පු කිරීම පිණිස ය.
5. කතකලි නර්තන සම්ප්‍රදාය උගන්වන ආයතනය .................................... ලෙස හැඳින්වේ.
6. පහතරට වන්නම් ගණන ................................ කි.
7. සතර අභිනයේදී මුහුණින් අදහස් ප්‍රකාශ කිරීම අයත් වන්නේ ....................... අභිනයටය.
8. කෝලම් ආදී චරිත නිරූපණය සඳහා ............................අංග රචනය යොදා ගනියි.
9. කෝල්පාඩුව ............................... නර්තන සම්ප්‍රදායටත් දේව කෝල්පාඩුව ........................ ...........නර්තන සම්ප්‍රදායටත් අයත් ය.
10. ශාන්තිකර්මවල දක්නට ලැබෙන වාදන අවස්ථාවන් ලෙස පූජාර්ථය සඳහා ..................... වාදනය ද ශිල්පීය දක්ෂතා පෙන්වීම සඳහා ............................ වාදනය ද දැක්විය හැකිය.

(ලකුණු 12)

02) ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අනුව පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. මාත්‍රා 2+3 දෙතිත තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
2. මාත්‍රා හතරේ තනිතතිට අයත් වන්නමක/ සින්දු වන්නමක කවියක් ප්‍රස්තාර කරන්න.
3. මාත්‍රා 3 තනි තිතට අයත් කස්තිරමක්/ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 4X3=12)

03) පහත සඳහන් මාතෘකා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

1. වන්නම් 2. මළ බෙර 3. ආහාර්ය අභිනය
4. කප් සිටුවීම 5. හත්පද (ලකුණු 4X3=12)

04)
1. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍ර තුනක් නම් කරන්න.
2. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බව මහාවංශයේ හා චූලවංශයේ සඳහන් සාධක දෙකක් ඇසුරින් විමසන්න.
3. විවිධ යුගයන්හිදී ලංකාවට පැමිණි විදේශීය සංචාරකයන් දෙදෙනෙකු සඳහන් කර නර්තන කලාව පිළිබඳ ඔවුන් දක්වා ඇති සධක දෙකක් විස්තර කරන්න.

05) 1. ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු විස්තර කරන්න.

2. කොහොඹාකංකාරියේ එන ගායනය සහිත නර්තන අංග දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

3. තෙල්මෙ සහ දෙවොල් නැටීම පහතරට ශාන්තිකර්මයක් ඇසුරින් විමසන්න.

06) 1. උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය නර්තන සම්ප්‍රදායන් එක බැගින් නම් කර , ඒවා ප්‍රචලිත ප්‍රදේශ මොනවාදැයි දක්වන්න.

2. එම නර්තන සම්ප්‍රදායන් සඳහා යොදාගන්නා සංගීත සම්ප්‍රදායන් සඳහන් කර ඒ සඳහා වාදනය කරන කවර හෝ වාද්‍ය භාණ්ඩ දෙකක් ගැන හැඳින්වීමක් කරන්න.

3. ඉන් එක් සම්ප්‍රදායක සංවර්ධනය කෙරෙහි බලපෑ ආගමික පසුබිම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

07) "පොදු ජනතාවගේ රසවින්දනය පෝෂණය කිරීම සඳහා රූපවාහිනී නාලිකා මගින් ප්‍රබල දායකත්වයක් ලබාදිය හැකියි ". මෙම කියමන නූතන රූපවාහිනී නාලිකා මගින් දක්නට ලැබෙන නර්තන කලා කෘති ඇසුරින් සාකච්ඡා කරන්න.